

# ප්‍රබුද්ධ ගීත කලාව සහ නන්දාමාලිනි ගී ලකුණේ දේශපාලන දර්ශනය

## කුට්ටම් පොකුණ



ලක්ෂ්මන් කොඩිතුවක්කු

ශ්‍රී ලාංකික කොදෙව්වේ ප්‍රබුද්ධ ගී සාහිත්‍ය අඹරේ බැබෙලන නමක් තබාගෙන ඇති නන්දාමාලිනියගේ ප්‍රසංගයක් නැවත වරක් නැරඹීමේ භාග්‍යය මෑතකදී මට ලැබිණි. ප්‍රබුද්ධ විදග්ධ, කලාත්මක ආදී සිංහල භාෂාවේ ආකර්ෂණීය වචන රොත්තෙන් හඳුන්වන කලාකරුවන් කාරියන් අතලොස්සෙන් ඇයට හිමිවන තැන කොතැනද කියා පුන පුනා කියන්නට අවශ්‍ය නොවේ. ලතා වල්පොල, ඇන්ජලින් ගුණතිලක වැනි ගීත කෝකිලාවියන් අතර, හුදු ගී රස විඳින ජනතාව අතර ඇය කෝකිලාවියක් නොකරීමට තරම් ජනතාව පරිස්සම් වුයේ ඇය ජනතාවාදී ගායිකාවක් ලෙසින්, පන්ති භේදයකින් තොරව, ගීය තුළින් ජනතාවගේ හදවත අභිබවා ප්‍රඥාව අවුළුවාලන්නට තරම් ප්‍රබුද්ධ වු නිසාය. තම ගීතය විඳින්නට නොව විඳවන්නන් වෙනුවෙන් මෙහෙයවු ගායිකාවක් නිසාය. මධුර මනෝහර ලාලිත්‍ය අභිබවා ගීයෙන් ලබාදෙන ඇයගේ පණිවිඩයට ජනතාව පෙම් බැන්දේ ඒ නිසාය.

60, 70 දශකයේ අප රටේ බිහිවු බොහෝ විචාරකයන්, ජෝතිපාල, මිල්ටන් බෙග්, ලතා වැනි කලාකරුවන් ජනප්‍රිය හා පීචන් ගොඩට දමා, නන්දාමාලිනී, අමරදේව, වික්ටර් වැන්නවුන් ප්‍රබුද්ධ ගොඩට දමා තෝරා බේරාගත් කාලය අද වන විට අවසන් වීගෙන යන බව මා හට දැනෙන්නේ අද ඒ ප්‍රබුද්ධ කලාකරුවන් සිටිනා තැන කොතැනද කියා විමසන විටය.

නන්දාමාලිනිය වඩාත් ප්‍රබුද්ධ ලේබලය යටතට වැටුණොත් සත්‍යයේ ගීතය නමැති ඒක පුද්ගල ප්‍රසංගයත් සමඟ බව අවිවාදිතය. එදා එම ප්‍රසංගය විචාරකයන් හැඳින්වුයේ කාලයේ අවශ්‍යතාවයන් පරිපූර්ණ කරන ප්‍රසංගයක් ලෙසිනි. 77 බලයට පත් වු එක්සත් ජනතා පක්ෂ රජයත් සමඟින් බිහිවු, විවෘත ආර්ථික ප්‍රතිපත්ති රටාවට එරෙහිව ගිය කලාකරුවන් කාරියන් අතරට නන්දා මාලිනියගේ නමද ඇතුළුවුයේ ඒ අයුරිනි. සරච්චන්ද්‍රලා වැනි බුද්ධිමත් මහාචාර්ය වරුන් පෑන නමැති අවිය අමෝරාගෙන විවෘත ආර්ථිකය නමැති බුවල්ලාට එරෙහිව සටන් කරන විට සුනිල් ආරියරත්නයන් තම පෑනෙන් නන්දා මාලිනියට ගී ලියා දුන්නේද එයට එරෙහිවය. එදා සාත්‍යයේ ගීතය නැරඹීමට ආ සියලුම ප්‍රේක්ෂකයන්ට ප්‍රබුද්ධ ප්‍රේක්ෂක ලේබලය ලැබී තිබුණු අතර, වසර කිහිපයක් ශාලාවල් පිරී ඉතිරී යා තරමටම සත්‍යයේ ගීතය විචාරකයන්ගේ ලිවීම අනුව ජනප්‍රිය රැල්ලේ නොව ප්‍රබුද්ධ රැල්ලේ ප්‍රසංගයක් බවට පත් වී තිබුණේය.

කඩුවක් අවැසි තැන කඩුවක් ගෙන කොටනු, පිළිම නෙලා නැති විරුවන් පිරිසක්, මැගේ නම ලංකාය, වැනි ගී තුළින් ඇය ගායනා කළ ගී තිබුණේ පීඩිත පංතියේ සැබෑ ස්වරූපයයි. ශ්‍රී ලාංකික මධ්‍යම පාංතික හා විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් තුළින් ආරම්භ වු ගී කැරැල්ලක් ලෙස එය ඇයගේ -පවන" හා සත්‍යයේ ගීතය හැඳින්වීම අතිශෝක්තියක් නොවන බව මගේ විශ්වාශයයි.

එදා රනිල් වික්‍රමසිංහ අධ්‍යාපන ඇමතිවරයා යටතේ ගෙන ඒමට අදහස් කළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා හා ධවල පත්‍රිකාවට එරෙහිව වීදි බැසගත් ශිෂ්‍යයන් වෙනුවෙන් කෑ මොරදුන් කලාකරුවන් රොත්තට නන්දා මාලිනියගේ ගීත කලාවද ඇතුළුවුයේ ඒ අයුරින් වීම අරුමයක් නොවේ. එදා විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් තුළ රැව් පිළිරැව් දුන්,

කකා බිබී නමන අතර නරුම යහල් යෙහෙළියන්
පන්දු කෙළින අතර ඉහළ පාසැල්වල අමනයන්
රට ගිනිගෙන ඇතිබව දත් මගේ එකම පුතුණුවන්
එගිනි නිවන මග සෙවීම වරදක් දැයි මා කියත්

ගී පද වැල්, භීෂණය මර්දනය හමුවේ ගැයෙන විට භීෂණයත් සමඟ රටම ගිනිගත් මාරාන්තික ප්‍රපංචයට ඒ ගීත කලාව අමා දහරක් වු බව තරුණ පරම්පරාව විශ්වාශ කළේය.

ඊටත් ඉහත "මේ සිංහල අපගේ රටයි අප ඉපදෙන මැරෙන රටයි" ගීත පදවැල් ගයමින් දෙමළ ජනතාවට විරුද්ධව අවි අමෝරාගත් පරම්පරාව ඊට පසුව කඩුවක් අවැසි තැන කඩුවක් ගෙන කොටන්නට ගොසින් පිළිම නෙලා නැති නරුමයන් බවට පත් වෙමින් භීෂණයත් සමඟ පස් යට වැළලී, ටයර් සෑයවල් මත දැවෙන විට නන්දා මාලිනී නමැති ප්‍රබුද්ධ ගායිකාව ආර්ථික අතින් ශක්තිමත් වී හමාරය. ඒ භීෂණයෙන් පසු ප්‍රේමදාස පාලන සමයේ ලතා වල්පොල නමැති ගීත කෝකිලාවිය ගී ගයන වේදිකාව මත, නන්දා මාලිනිය ප්‍රේමදාස මහතා අතින් සම්මාන ගන්නට තරම් අභිමානවත් වු අයුරු ඔබ සැමට මතක ඇති බව මම විශ්වාශ කරමි.

එසේනම් අප රටේ කලාකරුවකු ප්‍රබුද්ධ වන්නේ අදහන දේශපාලන දර්ශනය අනුවද? දැනුදු අප රටේ දැවෙන ප්‍රශ්න ගණනාවක් ඇත. රැකියා නැති තරුණ පරම්පරාව වීදි බැස කෑ ගසයි. විශ්ව විද්‍යාල පද්ධතිය තුළ අවුල් වියවුල්ය. පෞද්ගලික විශ්ව විද්‍යාල ආරම්භ කිරීමට ආණ්ඩුව සැරසෙන්නේ විශාල ගැටුම් මාලාවක් මැද්දේය. ඒ තිබු විවෘත ආර්ථිකය තවමත් එලෙසමය වීරයන්ගේ ඇට සම් මස් ලේ මැදින් ජයග්‍රහණය කළ ආණ්ඩුව යුධ ජයග්‍රහණයට මුවා වී සියලු දේ වසා ගැනීමට යත්න දරයි. පීචං, ප්‍රබුද්ධ විදග්ධ ආදී එකී නොකී මෙකී සියලුම කලාකරුවන් පිල් බෙදී

## ප්‍රබුද්ධයන් දියවී යන කාලය ආරම්භ වී ඇත.

තමාට සුදුසු දේශපාලන දර්ශනය ජනතාවට දීමට උත්සාහ දරයි. එසේනම් නන්දා මාලිනියන් ප්‍රබුද්ධ ගීත කලාව අද සම්මතයට ගැලපේද? එසේත් නැත්නම් තමන් අදහන

*ප්‍රසංගය අතරේදී ඇය කියා සිටියේ දැන් අපේ රට හොඳ බවයි. යුද්ධයේ අවසානයත් සමඟ සියල්ල යහමඟට හැරෙන බවයි. ඒ නිසා මෙරට සිටින ශ්‍රී ලාංකික උගත් ජනතාවට නැවත මව් රටට එන ලෙස ආයාචනය කළ ඈ ඊට පසු ගායනා කළේ මැගේ නම ලංකාය ගීයයි. "ඈ ඊට පසු කීවේ දැන් අපේ රටේ බර බාග නැති බවයි. බර බාග නැති වුවත්, එදා වේල කන්න නැති පීඩිත දුක්ඛිත ජනතාව තවමත් අප රටේ සිටින බව*

දේශපාලන දර්ශනය අනුව ඇය නිහඬද?

මෙරට පැවැත්වු ප්‍රසංගය අතරේදී ඇය මෙරට ප්‍රේක්ෂක ජනතාව වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කළාය. ඇය කියා සිටියේ දැන් අපේ රට හොඳ බවයි. යුද්ධයේ අවසානයත් සමඟ සියල්ල යහමඟට හැරෙන බවයි. ඒ නිසා මෙරට සිටින ශ්‍රී ලාංකික උගත් ජනතාවට නැවත මව් රටට එන ලෙස ආයාචනය කළ ඈ ඊට පසු ගායනා කළේ මැගේ නම ලංකාය ගීයයි. "මන්ද නාව කාරණාව එන්න අපේ වන්දනාව" ගීය ගායනා කළ ඈ ඊට පසු කීවේ දැන් අපේ රටේ බර බාග නැති බවයි. බර බාග නැති වුවත්, එදා වේල කන්න නැති පීඩිත දුක්ඛිත ජනතාව තවමත් අප රටේ සිටින බව ඇය කිව්වේ නැත. නැවත මව් රටට යන උගත් පිරිස වෙනුවෙන් රැකී රක්ෂා දොරටු විවර වන්නේ කෙලෙසද කියා ඇය පැහැදිලි කළේ නැත. තමන්ගේ දේශපාලන දර්ශණය තුළ රට තුළ ක්‍රියාත්මක වෙනවා නම් කබරගොයා වුවද තලගොයා කළ හැකි බව නන්දා මාලිනිය අපිට කියා පෑමට උත්සහ කළාද? එසේනම් ඇය ගැයු බොහෝ ගී වත්මන් ආර්ථික දේශපාලන යථාර්ථයත් සමඟ වැළලී ගොස් ඇත. එම ගී අදට වලංගු නැත. අන්තර් විශ්ව විද්‍යාලීය බල මණ්ඩලය හරහා ජනතා විමුක්ති පෙරමුණ බිලි බාගෙන ඇති අප රටේ රැඩිකල් ශිෂ්‍ය ව්‍යාපාරයට එසේ නම් අද නන්දා මාලිනියගේ ගී කලාව වලංගු නැත. කාලයක් දේශපාලන රටාවන් සමඟින් වෙනස් වන නන්දා මාලිනී, එස් බී දිසානායකලා, විමල් වීරවංශලා සමඟින් වෙනස් වන්නට ඔවුන්ට වුවමනාවක් නැත. ප්‍රබුද්ධ දේශපාලනයට අනුව විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් ගෙම්බන්ය. ඔවුන්ට -බක බක" ගෑම විනා වෙන කෙහෙල්මලක් කළ නොහැකි ය.

විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් හා අන්තරයට අනුව ආණ්ඩුව සැරසෙන්නේ නිදහස් අධ්‍යාපනයට කෙළින්නටය. දුප්පත් දරුවන්ගේ අධ්‍යාපනය වරප්‍රසාද ලත් පන්තියට ලබාදෙන්නටය. එදා යුඇන්පිය සැරසුනේත් ඔය දේටය. අප ජීවිත ලේ දන්දී එදා රැකගත් ඒ නිදහස් අධ්‍යාපනය අදත් අපි දිවි හිමියෙන් රැකගන්නෙමු. ඔවුන් එලෙස කියයි. එහෙත් එදා ඔවුන්ට කාලෝ ෆොන්සේකා සිටියේය. නන්දා මාලිනී සිටියේය. සුනිල් ආරියරත්න සිටියේය.

ගමනායක, විජේවීර සිටියේය. එහෙත් අද මේ කිසිවෙකු ඔවුන් සමඟ නැත. ඒ සියල්ල නිහඬය. නැත්තම් මෙපිලේය. විජේවීර, ගමනායක ජීවතුන් අතර සිටියා නම් විමල් වීරවංශ නාමය වෙනුවට ඇත්තේ ඒ නාමයයි. එසේනම් ඔවුන්ද නැත.

සෝවියට් දේශයේ බිඳ වැටීමක් සමඟින් දියවී ගිය සමාජවාදී කඳවුරක් අද ලෝකයේ හිස ඔසවා නැත. බරක් ඔබාමාගේ හොඳම මිතුරා බවට ඉන්දියාව පත්වන්නේ ඒ බිඳවැටීමේ එක් ප්‍රතිඵලයක් ලෙසිනි. එදා රුසියාව සමඟ මිත්‍ර ලීලාවෙන් සිටි ඉන්දියාව, විවෘත ආර්ථිකය බදාගෙන ඇමරිකන් ගැති ප්‍රතිපත්තයක් අනුගමනය කළ ජේ ආර් ජයවර්ධනට කොකා පෙන්වන විට අප රටේ ප්‍රබුද්ධ කලාකරුවන් සහ ජනතා විමුක්ති පෙරමුණද ජේ ආර් ට කොකා පෙන්නුවෝය.

අද ඔබාමා ඉන්දියාවේ ශිෂ්‍යයන් සමඟ අත් වැල් බැඳගෙන නටන විට අප රටේ ශිෂ්‍යයෝ නිදහස් අධ්‍යාපනය රැකගැනීමට යැයි කියා ගනිමින් විශාල අලකලංචියකට මුහුණ දී ඇත. එහෙත් අහිංසක ශිෂ්‍යයනි ඇස් ඇර බලාපල්ලා! ලෝකය අද බොහෝ වෙනස්ය. නන්දා මාලිනියට ප්‍රබුද්ධත්වය ලබා දුන් ඔබලා තවමත් යටි ගිරියෙන් කෑ ගසයි. එහෙත් ඇයම අපිට නැවත මව් රටට එන්නට ආරාධනා කරයි. උදුල් ප්‍රේමරත්නට, ඊළඟ ආණ්ඩුවකින් ඇමතිවරයෙක් විය හැකි ය. ඔහුට දන්ත වෛද්‍ය උපාධිය අහිමි වුවාට අනාගතයේදී හිමි වීමට දෑ බොහෝ ඇත. එහෙත් ඔබලාට හිමි වීමට ඇත්තේ කුමක්ද? ගුණදාස කපුගේ ජීවත්ව සිටියා නම් ඔය ප්‍රශ්නය ඇසිය හැකි ප්‍රබුද්ධ කලාකරුවා ඔහු පමණි. ඒ නිසා ඔබට එදා ජීවත් වු ජෝතිපාල ලා තවමත් ජනතාවාදී ජනප්‍රිය කලාකරුවෙක් බව දැන්වත් ඔබට දැනෙනු ඇත. ඉදිරියේදී අපිට සිටින්නේ ජනප්‍රිය කලාකරුවන් පමණි. ප්‍රබුද්ධයන් දියවී යන කාලය ආරම්භ වී ඇත.

